විදේශයකින් සටහනක්

හේමමාලා හේරත්

බටහිර ලෝකයේ රටකදී මෙන් නොව, මා දැන් සියල්ල දකින්නේ වෙනත්ම අයුරකිනි. පරිසරය, දේශගුණය, මිනිසුන්, ඔවුන්ගේ ඇඳුම්, පැළඳුම්, කතාබහ, සිරිත් විරිත් යන සියල්ලම වෙනස්ය. වෙනස්වී නැත්තේ මා සිතනා අයුරු පමණකි.

පෙනුමෙන් මා වෙනස් වී ඇද්දෝයි නොදනිමි. මට දැනෙන්නේ උදේ සිට රෑ බෝවනතුරු මා 'පිච්චෙනා බවකි.' විදුලි පංකාවකින් පමණක් සිරුරේ නැගෙනා දාහය නිවා දැමිය නොහැකි ය. වායුසමීකරණය කරනා ලද නිවසක උන්නද, එළියට බටකළ තේරෙන්නේ, ඉර අප විසින් කරන ලද පෙර පාප කර්මයකට, පිළිගැනීම සඳහා ලක ලැස්තිවන බවයි. එළියට බසිනා විට කුඩයක්, අයිස් වතුර බෝතලයක්, අව් කණ්නාඩි කුට්ටමක් අනිවාර්යෙන් ගෙන යා යුතුය. එමෙන්ම සමහර කාලවල හවස්-වරුවේ ඇඳෙනා මහා වැසි ජීවිතයේ කිසිදා දැක නොමැති තරමිය. මෙවැනි තද විදුලි කෙටීම් අකුණු සැර වඩා දැනෙන්නේ ඉහළ මාලයක සිට අහස දෙස බලන නිසාවන්ද ?

පෙරදි මෙන් ශීත කාලයට අඳිනා බර කබා කිසිවක් මෙහි අවශ්‍ය නැත. ඇඟට වඩාත් පහසු වන්නේ ඉන්දියානුවන් අඳිනා වර්ගයේ සහනැල්ලු පිළියෙන් නිම කළ උඩ කමිස හා කලිසමිය. මදෑ පෙරදිග හැසියන් ඇඟ වසෙනා ලෙස සුදෙන් සැරසෙන්නේ ඇයිදැයි මට තේරුම් ගියේ මෙහි පැමිණීමෙන් පසුවය.

කාර්යාලයකින් වැඩ කරවා ගැනීම ඉතා අසීරුය. විශේෂයෙන්ම ඔවුන්ගේ ඉංග්‍රීසි තේරුම් ගැනීමට නොහැකි වීම නිසාය. වෙලාවට වැඩ කිරීමේ පුරුද්දක් මොවුනට ඇත්තෙන්ම නැත. උදෑසන දහයට යැයි පැවසුවහොත් අඩුම ගණනේ දුරකතන ඇමතුම් හතර, පහකට පසුව දහවල් එක වන විට යමකු වැඩක් සඳහා ගෙන්වා ගත හැක. දියුණු රටක් දියුණු වීමේ රහස දැන ගැනීමට හොඳම ක්‍රමය නම් මෙවැනි රටක මාස කිහිපයක් ගත කිරීම යැයි සිතමි.

මෙහි මහා මාර්ග මැනවින් සාදා ඇත. රියදුරන් ද ශ්‍රී ලංකාවේ මෙන් නොව එක්තරා අන්දමකට විනීතය. එහෙත් සමහර ටැක්සි රියදුරන් සහ මෝටර් සයිකල්වරුන් මේ ගනයට වැටෙන්නේ නැත. රිය පැදවීමට මා තුළ ඇත්තේ බියකි. කොයි වේලේක හෝ වෙනත් රියක් පැමිණ මගේ රිය හප්පා දමාවිය යන සැකය හා භීතිය නිසාය.

ඉතා හොඳ සුපිරි වෙළඳ සැල් මෙන්ම ශ්‍රී ලංකාවේ බඳු පොළවල් ද මෙහි දැකිය හැක්කේය. ආසියාතික එළවළු, පලතුරු සියල්ල මෙහි වෙළඳාම් කෙරේ. වෙනසකට ඇත්තේ පුලුස්සන ලද ලාරන් හා කුකුළන් පෙති කපා විකිණීම ශ්‍රී ලංකාවේ දක්නට නොලැබීමය. එහි ගොස් එළවුළු ගැනීම එක්තරා අන්දමක යුද්ධයකි. තවත් අතකින් රසවත් අත්දැකීමකි. වරෙක කෙසෙල් විකුණන මිනිසකුගෙන් කෙසෙල් මිල ඇසීමට ගොස් විශාල අමාරුවකට වැටුණෙමු. ඔස්ට්‍රේලියාවේ අප සුලබව දකින්නේ එක් කෙසෙල් වර්ගයකි. මෙහි ඇති වයිවාරන්න කෙසෙල් මිල අසා අවසානයේදීය. අප පසුපස සැදී ඇති දිගු පෝලිම අප දුටුවේ.

මිනිසුන්ගේ සෝභාව නිසා වරෙක මට මගේ හඬ උස්කොට මගේ සැමියාට කතා කිරීමට සිදු වූයේය. එය ඇසුනු ඉන්දියානු ජාතිකයෙකු මා දෙස බැලුවේ නුරුස්නා අයුරිනි.

'අනේ අතිච්චං දැක් කාලේ ගෑනුන් ස්වාමි පුරුෂයාට කතා කරන හැටි' ලෙසින් මම එය මගේ බසට පරිවර්තනය කරගනිමි. අප කාරයට නැගීමට යද්දීත් ඒ මිනිසා, අප දෙස හැරී බලමින් යනු දුටු මම සිද්ධිය සැමියාට පවසා සිනාසුනෙමි.

අප නිතර ගිය සුපිරි වෙළඳ සංකීර්ණය හැඳින්වෙන්නේ 'පිරමිඩ්' නමිනි. මෙහි රියගාල තට්ටු ගණනාවකින් හෙබි එකකි. එකිනෙකට වෙනස් වන්නේ අංක හා වර්ණවලිනි. දිනක් කාරය හොයාගත නොහැකිව මගේ සැමියාට ආරක්ෂක භටයෙකු සමග ඔහුගේ මෝටර් සයිකලේ තට්ටු පුරා රවුම් ගසන්නට සිදුවිය. මට වූයේ දැනදිය දමමින් එක තැනක සිටගෙන සිටීමටය.

දැන් සිනා නැගුවත් එදා සිතේ ඇති වූ තොරිස්සුම මට අදද දැනෙන්නාක් වැනිය. දැන් නම් මා කරන්නේ කොළ කැබැල්ලක අංකය හා පහසය සලකුණු කර ගැනීමය. 'කරන වැඩය ගැන නිතර අවධානයෙන් සිටීමට' මෙහිදී ලැබෙන්නේ මනා පුහුණුවකි.

මෙහි උපත ලද සිංහල මිනිසුන් මට පෙනෙනුනේ බෙහෙවින් වෙනස්වය. ඔවුන්ගේ කතාව, ඇඳුම, පැළඳුම ශ්‍රී ලාංකික සිංහලයන්ට වඩා අමුතුය. ඔවුන් ලංකාව ගැන සිතන්නේ එය 'සැහකදබ' ලෙස තිබූ කාලයේ ම කියාය.

මෙහිදී මට හමු වූ ශ්‍රී ලාංකික සිසුවියක පැවසුවේ මුල්කාලයේ ඇයට දැනුණු තනිකම පිළිබඳවය. නිවසේදී සෑම දේම ළඟට ලැබුණු මුත් මෙහිදී තමන් තනියම ඒ දේ කිරීමට පුරුදු වූ අයුරු ඈ විස්තර කළාය. උදෑසන තැගිටීම, බඩු ගෙන ඒම, ඉවීම, දේශනවලට යෑම, යහළුවන් තෝරා ගැනීම මේ සෑමදෙයක්ම කරගත යුතු වූයේ තනිවමය.

ඇය පැවසූ අන්දමට මෙහි සිසු සිසුවියන් එකට මුසුවීමක් නොමැත. චීන, මැලේ, ඉන්දියානු සිසු සිසුවියෝ කල්ලි සැදෙති. ඔස්ට්‍රේලියාවේ මේ සිරිත මා දුටුවක් නොවේ. එමෙන් ම චීන ජාතික ශිෂ්‍ය, ශිෂ්‍යාවෝ ඉතා කැපවීමකින් වැඩ කරන්නෝය. ඔවුන් තුළ ඇත්තේ දැඩි ආත්ම සංයමයකි. තමා ඔවුන් දකින්නේ යාන්ත්‍රිකව යැයි එම සිසුවිය මට පැවසුවාය. එහෙත් ශ්‍රී ලාංකිකයන් තුළ දක්නට ලැබෙනා 'සංවිධානය' ඔවුන් තුළ නැතැයි ද ඈ පැවසුවාය.

ඇය විසින් විස්තර කරන ලද 'තනිකම' මම ද අත් විඳිමි. මා මගේ රටට එන්නේ කවදාදැයි බලා සිටින්නේ ඇඟිලි ගනිමිනි.

අමතක කරන්නෙපා සිංහල අත් අකුරු සිතින්

දැන් මම අන්තර්ජාලයේ සැරිසරමි. එය මහත් ආස්වාදජනකය. රූපවාහිනියෙන් අපට ඕනෑදෙයත් එපා දෙයත් දෙන විට අපට සිදු වුනේ ඔහේ බලා සිටීමට හෝ නිවා දැමීමටය. අන්තර්ජාලයේදී එසේ නොවේ. අපට අවශ්‍ය දෙය සොයා බැලිය හැකිය. අවශ්‍යනම් එය භාගත කරගෙන පසුව නැරඹීම පිනිස සුරැකිව තබා ගැනීමටද පුළුවන. දැන් අවශ්‍යවන්නේ සාරවත් වැඩසටහන් හැකිතරම් අන්තර්ජාලයට එක් කිරීමයි. එය ඔබටද මටද කළ හැක්කක් වීම අන්තර්ජාලය තුළ ඇති තවත් අපූර්වත්වයකි.

අන්තර්ජාලය තුළ ඔහේ ඉබාගාතේ සැරිසරමින් සිටි පසුගිය දිනෙක මා හට අපූරු ගී පදමාලාවක් හමුවිය. ශ්‍රී ලංකාව තුළ ප්‍රකට නොවූ මේ සුන්දර ගීතය බොහෝ සෙයින් වැදගත් වන්නේ විදෙස් ගතව සිටින ශ්‍රී ලාංකිකයන-ටයි. මේ සංවේදී වදන්වැල ඔවුනගේ සිත් ඇදගන්නා බව මා හට නො අනුමානය.

මේ ගීය විශාරද නිලා වික්‍රමසිංහගේ මාස්ටර් සර් ගී ප්‍රසංගය සඳහා නිලා සමග කපිල හේරත් ගැයූ ගීයකි. ගීතයට ප්‍රස්තුතවන්නේ දුරු රටක වෙසෙන පෙම්වතා සහ මව්බිමේ වෙසෙන සිය පෙම්වතිය අතර සුන්දර සංවාදයකි . දෙදෙනා සිය හැඟීම් මෙසේ හුවමාරු කරගනිති.

පෙම්වතා : සුන්දර කඳු වලල්ල මැද දුංගිඳ තවම ගලනවද
පෙම්වතිය : දුංගිඳ වතුර ගලන හඬ ඔච්චර දුරට ඇහෙනවද
පෙම්වතා : ඉන්දිය සාගර දිය මැද මුතු ඇට තවම තියෙනවද
පෙම්වතිය : සිංහල සිරිතට අත්බැඳ කවුරුත් කතා කරනවද

පෙම්වතිය : කැළණියෙ විහාරයට දෝත පුරා පිදෙන මලින් සුවඳින් බඳන් එවන්නට හැකි නම් සයුර උඩින්
පෙම්වතා : උන්නත් සයුරු හතෙන් එහා රටක ගතින් සිතින් මව් කිරි බිපු බිමට හිත එනවා ඇසිල්ලකින්

පෙම්වතා : ඇහුනත් අනේක ගී අප සවනට සතර අතින් ගියක් තියෙනවාද අපෙ හැලවිලි ගීය තරම්
පෙම්වතිය : ලැබුනත් දියුනුවෙ මහ විශ්ව දසුන් දකින වරම් අමතක කරන්නෙපා සිංහල අත් අකුරු සිතින්

ඔවුනගේ සිත් තුළ ජනිත වී ඇත්තේ සුන්දර සිතුවිලි සමුදායකි. දියුනුවේ මහා විශ්මයන් අත්වින්දද විදෙස් රටක තනි වූ විට තම මව්බිම සදෙව්ලොවට වඩා අගනා සුරපුරයක් සේ සිහියට නැගෙයි. මේ අත්දැකීම රචකයා සිය පෞද්ගලික අත්දැකීමක් ලෙස තම පරිකල්පනයට ආරූඪ කර ගනී. ඒ හරහා සියුම් හැඟීම් සමුදායක් මගින් සරළ එහෙත් ගැඹුරු සංවාදයක් ලෙස මේ ගීය මුතුවැලක් සේ අමුණා ඇත.

දුංගිඳ නැරඹූ කිසිවෙකුට එය අමතක කළ නොහැකි ලෙස සිත් තුළ සනිටුහන් වෙයි. සැපුම් සිය දහස් ගනනක් දුර ලෝකයේ කොයි කොදෙව්වක සිටියත් මනසින් ඒ ආනන්දය අත්විඳිය හැකිය. ඒ හඬ ඇසිල්ලකින් දෙසවනට ලං කර ගත හැකිය.

(සෑම සුන්දර මතකයක්මත් එසේමැයි.)

විදෙස්ගත පෙම්වතාට සිහිවන්නේ ඒ සුන්දර කඳුවලල්ල මැද ගලන දුංගිඳ දියඇළ්ලයි. පෙම්වතිය නැවත පැතයක් ලෙස විමසන්නේ "දුංගිඳ වතුර ගලන හඬ ඔච්චර දුරට ඇහෙනවද" යනුවෙනි. එය සියුම් ශෘංගාරාත්මක පැතයකි. ඇය ඔහුට තිළිණයක් යවන්න හැකිනම් ඒ සඳහා තෝරා ගන්නේ රං රිදී මුතු මැණික් නොවේ. කැළණියෙ විහාරයට දෝත පුරා පිදූ මල් සුවඳින් සුවඳ බඳිනි. මෙවන් සියුම් තැන් ස්පර්ශ කරන මේ රචකයා මනා පරිකල්පන ශක්තියකින් පොහොසත් අයෙකි.

"සිංහල සිරිතට අත්බැඳ කවුරුත් කතා කරනවද" " "උන්නත් සයුරු හතෙන් එහා රටක ගතින් සිතින්"" "මව් කිරි බිපු බිමට හිත එනවා ඇසිල්ලකින් "" "ඇහුනත් අනේක ගී අප සවනට සතර අතින්" " "ගියක් තියෙනවාද අපෙ හැලවිලි ගීය තරම්" "ලැබුනත් දියුනුවෙ මහ විශ්ව දසුන් දකින වරම්" " "අමතක කරන්නෙපා සිංහල අත් අකුරු සිතින්" වැනි ගී පද මේ ගීතයේ සුවිශේෂී අංගයන් ලෙස සඳහන් කළයුතුය. බොහෝ උපමා රූපක වලින් පිරිපුන් මේ රචකයා ඒවා මනා ලෙස හැසිරවීමේ දක්ෂතාව ද මේ පදරචනාවෙන් පෙන්නුම් කරයි. පද එකින් එක ගෙන විශ්ලේෂණය නොකළයුතු අන්දමේ කාටත් තේරෙන ඉතා සරළ බස්වහරක් යොදා ගැනීම අගනේය. ගීයකින් සිදු වියයුත්තේද එයමය මෙවන් සාරවත් ගී පද සංකල්පනාවන් මෑත යුගයේ ලංකාවේ බිහි නොවීමද සංවේගයට කරුනකි.

මේ මිහිරි ගීතයේ නිර්මාතෘ සොයා ගැනීම පිණිස මා විශාරද නිලා වික්‍රමසිංහට දුරකථනයෙන් කථා කළෙමි.ඇය පැවසූ පරිදි මේ ගීය 1998 දී නිර්මාණය වූවකි. අපට සිටින විශිෂ්ඨ ගී පද රචකයෙකු වන අශෝක කෝවිලගේ අතින් ලියැවුනු රමණීය ගී පද සංකල්පනාවකි. ඔහු ලියූ ගීත අතුරින් වැදගත් ස්ථානයක් හිමිවන්නේ විශාරද මාලිගී බුලත්සිංහල ගැයූ "සෙනෙහස ඉල්ලා ලියතඹරා ළඟ" ගීතයයි. විශාරද නිලා වික්‍රමසිංහ සහ කමල් අද්දෙ-රාච්චි ගයන "තුන් සිත දැහැන් ගත වෙනා" ප්‍රියාති ජයසිංහ ගයන "කඳුළු නිවන්නම් නෙත නොතෙමෙනවා නම්" කුමා අත්තනායක ගයන "කඳු අතරින් උදේ හවා රිය සක හසුරන මාගේ" සහ සුනිල් එදිරිසංහ ගයන "පාරු පාලමෙන්" අශෝක කෝවිලගේ අතින් ලියැවුනු අනෙකුත් මියුරු ගී පද සංකල්පනාවන්ය. මේ මිහිරි පදවැල සඳහා විශාරද නිලා වික්‍රමසිංහ යෙදූ මධුර තනුවද මේ ගීයේ විචිත්‍රවත් බව තවත් ඔප නංවා ඇත

සන්නස පාඨක ඔබට හඳුන්වාදීමට මා අදහස් කළේ මෙම අත්දැකීම ඔබට වඩාත් සමීප විය හැකිවේය යන අදි-ටනිනි. මේ ගීය හදමළුමඉදැ යූ ටියුබ් වල නිලා වික්‍රමසිංහ සුන්දර කඳු වලල්ල neela wickramasinha sundara kadu walalla with kapila herath යනුවෙන් ඉංග්‍රීසි අකුරින් ටයිප් කර ඔබට නැරඹිය හැකි ය.

(මෙය ඉතා පැරණි වීඩියෝවක් බැවින් මෙහි හඬ සහ දර්ශණ උසස් තත්වයක නැති බවද සලකන්න.)

පියල් යටවර
"කම්මිත්ත" "අතුරු පාර " "දොරටු රකින්නෝ" ටෙලි නාට්‍ය අධ්‍යක්ෂක
yatawarap@gmail.com skype — piyal_yatawara